ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2003 අංක 10 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 17 වන දින.]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2003 මාර්තු මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 9.50 යි.** තැපැල් ගාස්තුව : රු. 4.50 යි

# 2003 අංක 10 දරන දේශීය ආදයම්
# (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 17 වන දින]

එල්. ඩී. – ඕ. 91/2002

**2002 මාර්තු මස 31 වන දිනට පෙර ආදයම් හා වත්කම් වාර්තාවක් සපයා නොමැති තැනැත්තන්ට ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීමට හැකි කරවන්නා වූ ද : ප්‍රකාශයක් කර ඇති හා ප්‍රකාශයක් කර නොමැති තැනැත්තන්ට ඇතැම් සහන ලබාදීමට විධිවිධාන සලසන්නා වූ ද : පවත්නා බදු නීතිවලට අනුකූලව ඒ තැනැත්තන් අනාගතයේ ක්‍රියා කරන බව සහතික කරගැනීම අරගයා ඒ තැනැත්තන් ඇතැම් බදු ගෙවීමට බැඳී සිටීමේ වගකීමෙන් ආරක්ෂා කිරීම සහ ඇතැම් නීති ප්‍රඥප්ති යටතේ විමර්ශනයට පාත්‍රවීමට, නඩු පවරනු ලැබීමට සහ දණ්ඩන පනවනු ලැබීමට යටත්ව සිටීමෙන් නිදහස් කිරීම පිණිස ද : 2002 අංක 7 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත ඉවත් කිරීම පිණිස ද : ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2003 අංක 10 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2003 ජුනි මස 30 වන දිනට ප්‍රථම කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු බව.

**2.** (1) මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කවර හෝ නීතියක් යටතේ බදු පැනවීම හා සම්බන්ධව තත්කාලීනව බලපවත්නා යම් නීතියක් යටතේ නියම කරනු ලැබ තිබුණ ද, ඒ බද්දට යටත් වන තම ආදායම් ප්‍රභවයන් හා වත්කම් සියල්ල හෝ ඉන් යම් කොටසක් 2002 මාර්තු මස 31 වන දිනට පෙර යම් කාලසීමාවක් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ අදාළ බලධරයා වෙත හෝ ප්‍රකාශ කර නොමැති, ශ්‍රී ලංකාවේ වුව ද විදේශයක වුව ද සිටින යම් තැනැත්තකු විසින් 2002 අප්‍රේල් මස 1 වන දිනට, ඔහුගේ ආදායම් ප්‍රභවයන් හෝ වත්කම් පිළිබඳව, 2003 ජුනි මස 30 වන දින දී හෝ ඊට ප්‍රථම, කොමසාරිස් ජනරාල් වරයා වෙත, ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, 2002 මාර්තු මස 31 වන දිනට පෙර සියලු අදාළ කාලසීමාවන් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ අදළ බලධරයා වෙත නියමිත ප්‍රකාශයක් කර ඇති යම් තැනැත්තකු විසින් තමාගේ තත්වයේ නිවැරදිභාවය පිළිබඳව දැනගැනීම සඳහා 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කරනු ලැබිය හැකි අතර කොමසාරිස් ජනරාල්වරයා හෝ අදළ බලධරයා විසින්, 3 වන වගන්තියේ සඳහන් මුක්තිය ඒ තැනැත්තාට ලබාදිය යුතු ය.

2–H 017641–5,600 (2003/01)

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "ආදායම් ප්‍රභව" යන්නට මුදලින් හෝ වෙනත් යම් ආකාරයකින් ලැබෙන යම් ආදායමක් ඇතුළත් විය යුතු අතර "වත්කම්" යන්නට නිශ්චල දේපළ, චංචල දේපළ, බැංකු ශේෂ, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු, කාල නියම තැන්පතු හෝ වෙනත් යම් ආකාරයක තැන්පතු, ඇප වශයෙන් දෙන ලද මුදල් හෝ ණය හා අත ඇති මුදල් ඇතුළත් වේ.

(3) 2002 අප්‍රේල් මස 1 වන දිනට අත තිබුණු, පසුව වැය කර නොමැති මුදල්, මේ වගන්තියට අනුකූලව ප්‍රකාශ කිරීමට ප්‍රථම ආයෝජනය කළ යුතු ය, නැතහොත් බැංකුවක තැන්පත් කළ යුතු ය.

(4) (1) වන උපවගන්තියට අනුකූලව වූ යම් ප්‍රකාශයක් ලැබී දවස් තිහක් ඇතුළත, ඒ ප්‍රකාශය ලැබුණු බව, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් ම ලිඛිතව බලය පවරන ලද කොමසාරිස්වරයකුට වඩා පහත් නොවූ නිලයක් දරන නිලධරයකු විසින් ලියවිල්ලක් මගින් පිළිගනු ලැබිය යුතු ය.

ප්‍රකාශයක් කරන තැනැත්තාට දෙනු ලබන මුක්තිය.

**3.** (1) 2002 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් කාලසීමාවකට අදාළ ව, 2 වන වගන්තියට අනුකූලව ප්‍රකාශයක් කරන කවර හෝ තැනැත්තෙක්, ඒ ප්‍රකාශය –

(අ) බදු නොගෙවීම,
(ආ) ප්‍රකාශ කළ ආදයම් ප්‍රභවය හෝ වත්කම්,
(ඇ) ඒ වත්කම් සඳහා අරමුදල් උපයාගත් ලාභ හෝ ආදායම,
(ඈ) ඒ වත්කම් සඳහා අරමුදල් සපයාගත් ආකාරය,
(ඉ) ඉහත සඳහන් කරුණු වලට සම්බන්ධ හෝ ආනුෂංගික යම් කාරණා,

සම්බන්ධයෙන් වන තාක් දුරට මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් නීතියක් යටතේ බදු ගෙවීමට පවත්නා බැඳීමෙන් හෝ මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් නීතියක් යටතේ යම් වරදක් සම්බන්ධව විමර්ශනය කරනු ලැබීමෙන්, නඩු පවරනු ලැබීමෙන්, හෝ දණ්ඩනයකට යටත් වීමෙන් පූර්ණ මුක්තිය ලැබිය යුතු ය.

(2) 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කරන තැනැත්තකුට මෙහි ඉහත නිශ්චිතව සඳහන් පරිදි පූර්ණ මුක්තිය ප්‍රදානය කරන බවට, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් පනත් ක්‍රියාවේ යෙදීම භාර අදාළ බලධරයා විසින් වග බලාගනු ලැබිය යුතු ය.

(3) (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ කාර්ය සඳහා මේ පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද යම් දේපළක් සම්බන්ධයෙන් 2002 මාර්තු මස 31 වන දින හෝ එදිනට පසුව සිදුවන යම් ගනුදෙනුවක් සඳහා, එම ගනුදෙනුව 2002 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර සිදු වී ඇති ගනුදෙනුවක් ලෙස සලකා, (1) වන උපවගන්තියේ සඳහන් මුක්තියම එයට ද ලබා දිය යුතු ය.

විමර්ශන, නඩු පැවරීම් යනාදිය ඉල්ලා අස්කර ගත යුතු බව.

4. (1) 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කරන තැනැත්තකුට එරෙහිව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් නීතියක් යටතේ, 2002 මාර්තු මස 31 දින හෝ එදිනට පෙර ආරම්භ වී තිබෙන යම් විමර්ශනයක් හෝ නඩු පැවරීමක් හෝ එවැනි තැනැත්තකු මත පනවන ලද එහෙත් ගෙවා නොමැති දණ්ඩන මුදලක්, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ඉල්ලා අස්කර ගනු ලැබිය යුතු ය.

(2) 2 වන වගන්තියට අනුකූලව ප්‍රකාශයක් කර තිබෙන තැනැත්තකු සම්බන්ධයෙන් 2002 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් කාලසීමාවක් වෙනුවෙන් වූ බදු පිළිබඳව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කවර හෝ නීතියක් යටතේ වන යම් බද්දක් මතභේදයට විෂය වී තිබෙන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය ලෙස ඒ තැනැත්තා නිශ්චිතව ප්‍රකාශ කරන බදු මුදල නිවැරදි බවට සහ ඒ කාලසීමාව වෙනුවෙන් ඒ තැනැත්තා ගෙවීමට බැඳී සිටින අවසානාත්මක බද්ද එයින් පිළිබිඹු වන බවට මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් පනත් ක්‍රියාවේ යෙදවීම භාරව සිටින අදාළ බලධරයා විසින් පිළිගනු ලැබිය යුතු ය :

එසේ වුව ද, 2 වන වගන්තියට අනුකූලව ප්‍රකාශයක් කරන තැනැත්තකුගේ එකහත්වයෙන් සමථයකට එළඹ තිබෙන, මතභේදයට විෂය වූ කිසි බද්දක් පිළිබඳ කටයුතු නැවත ආරම්භ නොකළ යුතු ය.

(3) 2 වන වගන්තියට අනුකූලව ප්‍රකාශයක් කර නොමැති තැනැත්තකු සම්බන්ධයෙන්, 2000 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් කාලසීමාවක් වෙනුවෙන් වූ බදු පිළිබඳව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කවර හෝ නීතියක් යටතේ යම් බද්දක් මතභේදයට, විෂය වී තිබෙන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය ලෙස ඒ තැනැත්තා නිශ්චිතව ප්‍රකාශ කරන බදු මුදල, නිවැරදි බවට සහ ඒ කාලසීමාව වෙනුවෙන් ඒ තැනැත්තා ගෙවීමට බැඳී සිටින අවසානාත්මක බදු බැරකම එයින් පිළිබිඹු වන බවට, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් පනත් ක්‍රියාවේ යෙදවීම භාරව සිටින අදාල බලධරයා විසින් පිළිගනු ලැබිය යුතු ය :

එසේ වුව ද, 2 වන වගන්තියට අනුකූලව ප්‍රකාශයක් නොකළ තැනැත්තකුගේ එකඟත්වයෙන් සමථයකට එළඹ තිබෙන මතභේදයට විෂය වූ කිසි බද්දක් පිළිබඳ කටයුතු නැවත ආරම්භ නොකළ යුතු ය.

(4) මෙහි ඉහත (2) වන හා (3) වන උපවගන්තිවල කාර්ය සඳහා "නිශ්චිතව ප්‍රකාශ කරන බදු මුදල" යන්නට 2002 සැප්තැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර 2001/2002 තක්සේරු වර්ෂය සඳහා 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ XIII වන පරිච්ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් තැනැත්තකු විසින් ගෙවන ලද යම් නිශ්චිත බද්දක් ද ඇතුළත් වේ.

2002/2003 තක්සේරු වර්ෂය සඳහා බද්දට යටත්වීම.

**5.** (1) 2002/2003 තක්සේරු වර්ෂය සඳහා ආදයම් බදු ගෙවීමට යටත් වන්නා වූ ද, 2 වන වගන්තියට අනුකූලව ප්‍රකාශයක් කර තිබෙන්නා වූ ද, තමාගේ නමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් බදු ලිපිගොනුවක් විවෘත කරනු ලැබ නොමැති වූ ද, යම් තැනැත්තකු විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ආදායම් බද්ද, 2003 සැප්තැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර සම්පූර්ණයෙන් හෝ එයින් නොගෙවා තිබෙන කොටස හෝ ගෙවනු ලැබුවහොත්, ඒ තැනැත්තා නඩු පවරනු ලැබීමකට හෝ දණ්ඩනයකට හෝ යටත් නොවිය යුතු ය.

(2) (අ) 2002/2003 තක්සේරු වර්ෂයේ මුල් කාර්තුව සඳහා ආදායම් බදු වාරිකය ගෙවීමට යටත් වන්නා වූ ද, තමාගේ නමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් බදු ලිපිගොනුවක් විවෘත කරනු ලැබ තිබෙන්නා වූ ද, එම බදු

ගෙවා නොමැති හෝ අඩුවෙන් ගෙවා සිටින යම් තැනැත්තකු විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ආදයම් බදු මුදල සම්පූර්ණයෙන් හෝ එයින් නොගෙවා තිබෙන කොටස හෝ 2003 සැප්තැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ගෙවනු ලැබුවහොත්, ඒ තැනැත්තා නඩු පවරනු ලැබීමකට හෝ දණ්ඩනයකට හෝ යටත් නොවිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් පරිදි වූ යම් තැනැත්තකු විසින්, 2002/2003 තක්සේරු වර්ෂය සඳහා අනෙකුත් සියලු කාර්තුවල වාරික සහ අවසාන ගෙවීම, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතට අනුකූලව ඒවා ගෙවනු ලැබිය යුතු දිනවල දී ගෙවනු ලැබිය යුතු ය. මෙම ගෙවීම් කිරීමෙහි ලා යම් පැහැර හැරීමක් වුවහොත්, ඒ පනත යටතේ එම හිඟ බද්දට අදාළ දණ්ඩන බලාත්මක කරනු ලැබීම, එහි ප්‍රතිඵලය විය යුතු ය.

(3) 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කර ඇත්තා වූ සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කවර හෝ නීතියක් යටතේ 2002 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා ආදායම් බදු නොවන යම් බද්දක් ගෙවීමට යටත් වන්නා වූ යම් තැනැත්තකු විසින්, ඒ සියලු බදු, ඉහත කී නීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි ගෙවනු ලැබිය යුතු ය.

**6.** (1) මෙහි උපලේඛනයේ සඳහන් නීති ක්‍රියාවේ යෙදවීමට බලය පැවරී තිබෙන යම් අධිකාරයක් විසින් හෝ ඒ නීතිවල විධිවිධාන ක්‍රියාවේ යෙදවීමෙහි නිරතව සිටින වෙනත් සියලු නිලධරයන් විසින්, ප්‍රකාශකයාගේ අනන්‍යතාව පිළිබඳව සහ 2 වන වගන්තියට අනුකූලව යම් තැනැත්තකු විසින් 2 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයක අන්තර්ගත යම් කාරණයක් හෝ දෙයක් පිළිබඳව පරම රහස්‍යභාවය සෑම කල්හි ම රැකිය යුතු හා රැකීමට සහාය විය යුතු ය. රහස්‍යභාවය.

(2) මෙහි උපලේඛනයේ සඳහන් කවර හෝ නීතියක් යටතේ (1) වන උපවගන්තියේ සඳහන් නිලධරයන් අතුරින් යම් නිලධරයකු විසින් දී තිබෙන රහස්‍යභාවය පිළිබඳ දිවුරුම මේ පනත යටතේ දෙන ලද රහස්‍යභාවය පිළිබඳ දිවුරුමක් ලෙස සැලකිය යුතු අතර, ඒ දිවුරුම උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය. තව ද

මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කළ තැනැත්තකුගේ අනන්‍යතාවය හෙළිදරව් කරන ලෙස හෝ ඒ ප්‍රකාශයක ඇතුළත් යම් තොරතුරක් හෙළිදරව් කරන ලෙස යම් ප්‍රකාශයක් කළ තැනැත්තකුට හෝ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකුට නියම කිරීමට, තත්කාලීනව බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද කිසිදු පරීක්ෂණ කොමිෂන් සභාවකට හෝ පත් කරන ලද නියාමකයකුට හිමිකම නොමැති විය යුතු ය.

(4) 1994 අංක 19 දරන, අල්ලස් සහ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පවරන ලද නඩුවක නඩු කටයුතු කරගෙන යාමේ දී හැර කිසිදු අධිකරණයක් විසින්, (1) වන උප වගන්තියේ සඳහන් යම් තැනැත්තකුට, 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කළ තැනැත්තකුගේ අනන්‍යතාව හෙළිදරව් කරන ලෙස හෝ ඒ ප්‍රකාශයක ඇතුළත් යම් තොරතුරක් හෙළිදරව් කරන ලෙස නියම නොකළ යුතු ය.

සැක දුරුකිරීම.

7. (අ) මුදලක් දරන හෝ යම් ආයෝජනයක් හිමි තැනැත්තකු පිළිබඳ සඳහනකට ඒ මුදල හෝ ආයෝජනය තමාගේ නමින් හෝ වෙනත් යම් නමකින් හෝ නමක් නොමැතිව දරන තැනැත්තා පිළිබඳ සඳහනක් ඇතුළත් වන බව ;

(ආ) යම් තැනැත්තකු විසින් ඔහුට ලැබිය යුතු බදු ආපසු ගෙවන ලෙස හිමිකම් කියා සිටීම හෝ එසේ ආපසු අයකර ගැනීම සඳහා නඩු කටයුතු පැවරීම හෝ මෙහි උපලේඛනයේ සඳහන් කිසිදු නීතියක් යටතේ ආරක්ෂාව හෝ වරප්‍රසාදයක් ඉල්ලා සිටීම, මේ පනතේ අන්තර්ගත කිසිවකින් වැළැක්වෙන ලෙස කියවා තේරුම් නොගත යුතු බව,

සැක දුරුකිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

8. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා බලාත්මක කිරීමේ කාර්යය සඳහා නියම කළ යුතු යයි මේ පනතින් නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට බලය පැවරී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු අනුමතය සඳහා හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවන පරිදි ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබුවා සේ සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලද ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

9. මේ පනතේ විධිවිධාන ප්‍රයෝජනයට ගැනීමට අදහස් කරන යම් තැනැත්තකු විසින් මේ පනතේ දැක්වෙන කාර්ය පටිපාටියට අනුකූලව සහ එහි නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත එසේ කළ යුතු ය. මේ පනතේ විධිවිධානවලට අනුකූලව අවශ්‍ය පියවර ගැනීම එලෙස පැහැර හරින යම් තැනැත්තකු සම්බන්ධයෙන් 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත යටතේ කටයුතු කරනු ලැබීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය. මේ පනතේ විධිවිධාන තුළ ක්‍රියා නොකිරීමේ ප්‍රතිවිපාක.

10. අදාළ නීතිවලට අනුකූලව බද්දක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති දින සිට අවුරුදු පහක කාල සීමාවක් ඉකුත් වීමෙන් පසුව මෙහි උපලේඛනයේ සඳහන් කවර හෝ නීතියක් යටතේ යම් බද්දක් අයකර ගැනීම සඳහා කිසිදු නඩු කටයුතු හෝ වෙනත් කටයුතු පැවරීම හෝ නොනිමිව පවත්නා යම් නඩුවක් පවත්වාගෙන යාම හෝ නොකළ යුතු ය. අන්තර්කාලීන විධිවිධාන.

2002 අංක 7 දරන පනත ඉවත් කිරීම සහ ව්‍යාවර්තන.

**11.** (1) 2002 අංක 7 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 2002 අංක 7 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත ඉවත් කරනු ලැබුව ද එය ඉවත් කරනු ලැබීමට ප්‍රථම ඒ පනතේ 2 වන වගන්තියට අනුකූලව කරන ලද සෑම ප්‍රකාශයක් ම, මේ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ වගකීමෙන් යම් මුක්තියක් හෝ නිදහස් කිරීමක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා එය 2 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයක් ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියට අනුකූලව යම් තැනැත්තකුගේ ප්‍රකාශයක් පිළිගනු ලැබ ඇති ලෙස සැලකෙන්නේ ද ඒ තැනැත්තා විසින් ඔහුගේ කැමැත්ත පරිදි, ඒ ප්‍රකාශය මේ පනතේ විධිවිධානවලට අනුකූල කරවීම පිණිස, එහි යම් විවර්තනය කිරීමක්, සංශෝධනයක් හෝ වෙනස් කිරීමක් සිදු කිරීමට අදහස් කරන බව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස් තුනක කාලසීමාවක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ අදාළ බලධරයා වෙත ලියවිල්ලක් මගින් දැනුම් දෙනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**13.** මේ පනතෙහි-

"බලධරයා" යන්නට, උපලේඛනයේ සඳහන් නීති ක්‍රියාවේ යෙදීම භාර යම් දෙපාර්තමේන්තුවක් ද ඇතුළත් වේ ;

"සමාගම", "පුද්ගල මණ්ඩලය" සහ "හවුල් ව්‍යාපාරය" යන්නෙහි, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

''කොමසාරිස්-ජනරාල්වරයා'' යන්නෙහි 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

''නිශ්චල දේපළ'' යන්නට ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පිහිටි ඉදිකළ හෝ ඉදිකරමින් පවතින යම් ගොඩනැගිල්ලක් ඇතුළත් වේ ;

''විමර්ශනය'' යන්නට, උපලේඛනයේ සඳහන් නීති යටතේ පරීක්ෂණයක්, ප්‍රශ්න කිරීමක්, සොදිසි කිරීමක් හෝ ඒ සමාන යම් ක්‍රියාවක් අදහස් වේ ;

''මුදල'' යන්නට, ශ්‍රී ලංකා රුපියල් වශයෙන් හෝ විදේශීය ව්‍යවහාර මුදල් වශයෙන් ප්‍රකාශිත කවර හෝ මුදලක් ඇතුළත් වේ ;

''චංචල දේපළ'' යන්නට, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක ඇති සියලු චංචල දේපළ ඇතුළත් වන නමුත් එයට මුදල් ඇතුළත් නොවේ ;

''වරද'' යන්නට, උපලේඛනයේ සඳහන් කවර හෝ නීතියක කවර හෝ වරදක් ඇතුළත් වේ ;

''තැනැත්තා'' යන්නට, සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ ;

''බද්ද'' යන්නට, මෙහි උපලේඛනයේ සඳහන් නීතිවලින් කවර හෝ යම් නීතියක් යටතේ ගෙවිය යුතු හෝ අයවිය යුතු යම් බද්දක්, අයකිරීමක් (යම් වරදක් සම්බන්ධයෙන් වූ යම් දණ්ඩනයක් ඇතුළුව) දණ්ඩනයක්, අභිභාරයක් හෝ දඩයක් ඇතුළත් වේ ;

''මතභේදයට විෂය වූ බද්ද'' යන්නට, මේ පනතේ උපලේඛනයේ සඳහන් කවර හෝ නීතියක් යටතේ තක්සේරු කරන ලදුව, කොමසාරිස්-ජනරාල්වරයා, අදාළ බලධරයා හෝ අදාළ තැනැත්තා විසින් නොපිළිගෙන තිබෙන බද්දක් ඇතුළත් වේ.

## උපලේඛනය (2,3,4, හා 6 වන වගන්ති)

1. 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත.
2. 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත.
3. 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත.
4. 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත.
5. 1963 අංක 11 දරන මුදල් පනත.
6. 1996 අංක 5 ජාතිය රක ගැනීමේ දායක මුදල් පනත.
7. 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත.
8. 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත.
9. 1982 අංක 25 දරන ධන බදු අධිභාර පනත.
10. 1989 අංක 8 දරන ධන බදු අධිභාර පනත.
11. 1982 අංක 26 දරන ආදායම් බදු අධිභාර පනත.
12 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාර පනත.
13. 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත.
14. 1991 අංක 17 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත.
15. 1992 අංක 32 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත.
16. 1993 අංක 28 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත.
17. 1994 අංක 23 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත.
18. 1995 අංක 13 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත.
19. 2001 අංක 6 දරන ආදායම් බදු අධිභාර පනත.
20. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත.
21. 1980 අංක 13 දරන මුදල් බදු පනත.
22. විනිමය පාලන පනත (423 වන අධිකාරය)
23. 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත.
24. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත.
25. සුරාබදු ආඥාපනත (52 වන අධිකාරය)
26. රේගු ආඥාපනත (235 වන අධිකාරය)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.